ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2017

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

---

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

A - කොටස අනිවාර්ය ප්‍රශ්න 7 කි. මේ සඳහා මුළු ලකුණු 20 කි. උසස් මූල්‍ය ගිණුම්කරණයේ විෂය ආවරණය වන පරිදි ප්‍රශ්න යොමු කරමින් දැනුම විමසීමට ලක්ව ඇත. ස්ථාවර වත්කම් ක්ෂය කිරීම, ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර, පාලන ගිණුම් සම්බන්ධ දැනුම, ස්කන්ධ කොටස් හා ණයකර පිළිබඳ මූලික අවබෝධය සහ හවුල් ව්‍යාපාර ආඥා පනත පිළිබඳ අවබෝධය විමසා බැලීමට මෙම ප්‍රශ්න යොමුකර ඇත.

1.4 සහ 1.5 ප්‍රශ්නවලට නිවැරදි උත්තර වැඩි දෙනෙක් සපයා නොතිබුණි. ප්‍රශ්න අංක 1.4 හි ණයකර නිකුත් කිරීමෙන් සමාගමට ඇති වාසි වෙනුවට ණයකර හිමියාට ලැබිය හැකි වාසි සඳහන් කිරීමට අයදුම්කරුවන් පෙළඹී ඇත. ප්‍රශ්නය කියවා අවබෝධ කර නොගැනීම නිසා මෙම ප්‍රශ්න දෙකට නිවැරදි උත්තර සැපයීමට නොහැකි වී තිබුණි. ප්‍රශ්න අංක 1.6 සඳහා ජර්නල් සටහන් ලිවීමේදී සංලක්ෂ්‍යය (narrations) බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ඉදිරිපත් කර නැත. එමෙන්ම නිවැරදි කොටස් සංඛ්‍යාව හා මූල්‍ය අගය ගණනය කිරීමට අසමත් වූ අයදුම්කරුවන් ද විය. ප්‍රශ්න අංක 1.7 හි හවුල් ව්‍යාපාර 1890 ආඥා පනත 24 වගන්තිය පිළිබඳ අයදුම්කරුවන්ගේ න්‍යායාත්මක දැනුම දුර්වල මට්ටමක පැවතුණි.

පොදුවේ අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු රැස්කර ගැනීමට වැඩිදෙනෙක් සමත් විය. විෂය නිර්දේශයට අනුකූලව දැනුම වර්ධනය කර ගැනීමෙන් හා අදාල ස්ව-අධ්‍යයන පොත් පරිශීලනය කිරීමෙන්, තම දැනුම තහවුරු කර ගැනීමෙන් වැඩි ලකුණු ලබා ගැනීමට අයදුම්කරුවන් උනන්දු විය යුතුය.

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

වෙළෙඳ ගෙවිය යුතු මුදල් (ණයහිමි) පාලන ගිණුම පිළියෙල කිරීම හා 2016 ජූලි 31 දිනට වෙළෙඳ ගෙවිය යුතු මුදල් පාලන ගිණුමේ ශේෂය, එදිනට තනි පුද්ගල ගෙවිය යුතු මුදල් ගිණුම්වල ශේෂ එකතුව සමග සැසඳීමේ ප්‍රකාශනයක් පිළියෙල කිරීම වෙනුවෙන් ලකුණු වෙන්කර ඇත. වැඩි දෙනෙක් මුළු ලකුණු ලබා ගැනීමට සමත් විය. ලකුණු නොලද අයදුම්කරුවන් සටහන් නිවැරදිව හඳුනා නොගැනීම නිසා පාලන ගිණුමට ඇතුලත් කළයුතු අයිතමයන් සැසඳුම් ප්‍රකාශයේ පෙන්වා තිබිණි. පාලන ගිණුමේ ආරම්භක ශේෂයන් හා ගනුදෙනු සටහන් හර, බැර නිවැරදිව හඳුනා නොගෙන මාරුකර සටහන් කිරීම්ද වැරදි උත්තර අතර විය.

### ප්‍රශ්න අංක 03

හවුල් ව්‍යාපාරයක ලාභා'ලාභ විසර්ජන ගිණුම පිළියෙල කිරීමේ දැනුම විමසා ඇත. අයදුම්කරුවන් තරමක් දුරට සාර්ථකව උත්තර සැපයීමට සමත්ව ඇත. එහෙත් ලාභා'ලාභ විසර්ජන ගිණුම වෙනුවට ජංගම ගිණුම පිළියෙල කිරීම, හවුල්කරුවන්ට අදාල ගැනිලි පොලී නිවැරදිව ගණනය නොකිරීම, මෙන්ම ලාභා'ලාභ විසර්ජනය කිරීමේදී අනුපාත නිවැරදිව යොදා නොගැනීම වැනි වැරදි දක්නට විය. එක් හවුල්කරුවෙක්ගේ (රොෂාන්) අර්ධ වාර්ෂික ගැනිලි පොලී නිවැරදිව සමහර අයදුම්කරුවන් ගණනය කර නැති අතර ඒ වෙනුවට වර්ෂයට අදාල පොලී පෙන්වා තිබුණි.

## ප්‍රශ්න අංක 04

ගලපන ලද මුදල් පොත සහ බැංකු සැසඳුම් ප්‍රකාශය පිළියෙල කරන ලෙස ප්‍රශ්නයේ දක්වා ඇත. වැඩිදෙනෙක් සතුටුදායක අන්දමින් ලකුණු ලබාගත් ප්‍රශ්නයකි. ඇතැම් අයදුම්කරුවන් ගලපන ලද මුදල් පොතට අදාල සටහන් හඳුනා නොගැනීම නිසා වෙන්කළ ලකුණු නොලැබීම සිදුවිය. එම අයදුම්කරුවන් ගලපන ලද මුදල් පොත පිළියෙල කිරීම පිළිබඳව නිසි අවබෝධයෙන් ක්‍රියා කර නැත.

මුදල් පොතේ ශේෂය ගලපා නිවැරදි ශේෂය බැංකු සැසඳුමට ගෙන ඒම වැඩි දෙනෙක් මගහැර තිබුණි. සමහර අයදුම්කරුවන් ගලපන ලද මුදල් පොතෙහි දැක්විය යුතු ගැලපීම් බැංකු සැසඳුම් ප්‍රකාශය තුළ දක්වා තිබීම නිසා ලකුණු අහිමි කරගෙන තිබුණි.

## ප්‍රශ්න අංක 05

ගොඩනැගිල්ලක් ඉදිකිරීමේ වියදම් ප්‍රාග්ධනීත කිරීම සම්බන්ධයෙන් හා ගිණුම් වර්ෂය අවසානයේ ධාරණ අගය ගණනය කිරීමට මෙම ප්‍රශ්නය යොමුකර ඇත. සමහර අයදුම්කරුවන් ප්‍රාග්ධනීත අගය සෙවීමේදී වර්පනම් සැළකිල්ලට ගැනීම අනවබෝධයෙන් කර ඇති අතර සමුච්චිත ක්ෂය නිවැරදිව ගලපා නැත. සමහර අයදුම්කරුවන් ඉදිකල වර්ෂය නොසලකා ක්ෂය ගලපා ඇත. නමුත් අයදුම්කරුවන් වැඩි දෙනෙක් මේ ප්‍රශ්නය සඳහා සතුටුදායක අන්දමින් උත්තර සපයා තිබුණි.

## ප්‍රශ්න අංක 06

ලාභ අපේක්ෂාවෙන් තොරව පැවැත්වෙන සමිති සමාගම් ගිණුම් සම්බන්ධ දැනුම විමසීමට මෙම ප්‍රශ්නය යොමුවේ. උත්තර සපයන ලද අයදුම්කරුවන් ලබාගත් ලකුණු මධ්‍යස්ථ මට්ටමක පැවතුණි. වර්ෂය මුල සම්මුච්චිත අරමුදල ගණනය කිරීම පිළිබඳව මූලික අවබෝධය නැති අයදුම්කරුවන් ද විය. වැරදි උත්තර අතර වර්ෂයට අදාල දායක මුදල සමුච්චිත අරමුදල ලෙස පෙන්වීමට කටයුතු කළ අයදුම්කරුවන් ද වූහ. සමහර අයදුම්කරුවන් දායක මුදල් ගිණුම් පිළියෙල කිරීමේදී උපචිත හා කලින් ලැබීම් නිවැරදිව ගැලපීමට සමත්ව නැති අතර න්‍යායාත්මක වැරදි සිදුකර ඇත. වර්ෂය මුල ශේෂයන් අදාල ගිණුම්වල නිවැරදිව පෙන්වීමට සමත්ව නැත.

## <u>C කොටස</u>

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

## ප්‍රශ්න අංක 07

ක්‍රීඩා සමාජයක වර්ෂය අවසානයේ ආදායම් හා වියදම් ගිණුම පිළියෙල කළයුතු විය. අයදුම්කරුවන් විසින් සමිති සමාගම් ගිණුම් සම්බන්ධයෙන් දායක මුදල් ගණනය කිරීමේ දැනුම දියුණු කරගත යුතු වේ. නිවැරදිව ප්‍රශ්නය හඳුනාගෙන උත්තර සපයන ලද සමහර අයදුම්කරුවන්ගේ ලකුණු ඉහළ මට්ටමක පැවතුණි. ආරම්භක ශේෂ, අවසාන ශේෂ හඳුනා ගනිමින් නිවැරදිව ගැලපීමට ඇතැම් අයදුම්කරුවන් සමත්ව නැත. දායකත්ව මුදල් ගණනය සරල වුවත් එය නිවැරදිව පෙන්වීමට සමහර අයදුම්කරුවන් අසමත්ව ඇත. සමහර අයදුම්කරුවන් පෙරවැඩ සහ ගැලපීම් පැහැදිලිව ඉදිරිපත් කර නැත.

## ප්‍රශ්න අංක 08

තේවලස්වාමි ව්‍යාපාරයක මූලික දත්ත ආශ්‍රයෙන් ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කර යුතු විය. මුළු ලකුණු ලබාගත් ප්‍රතිශතය අවම මට්ටමක විය. ඇතැම් අයදුම්කරුවන් උත්තර සැපයීමට උත්සාහ කර නොතිබුණි. වර්ෂය මුල ප්‍රාග්ධනය හා ණයහිමි ගිණුම ගැලපීම් කර ගැනුම් සොයා ගැනීමට, ආරම්භක ශේෂ ගලපා නිවැරදි දත්ත ලබා ගැනීමට උත්සාහ කළ යුතු වේ. එසේ උත්සාහ නොගැනීමෙන් වර්ෂය මුල ප්‍රාග්ධනය හා වෙළෙඳ ගිණුමට නියමිත අදාල ලකුණු අහිමි වී ඇත. රු.5,000,000/- ක ණය මුදල සඳහා ගෙවන ලද පොලිය නිවැරදිව ගණනය කර නැති අතර වර්ෂයට අදාල පොලිය ගිණුම්ගත කිරීමට සමහර අයදුම්කරුවන් පෙලඹී තිබුණි. ගිණුම්කරණ ප්‍රමිත සම්බන්ධ අවබෝධය වර්ධනය කරගත යුතු වේ.

**ප්‍රශ්න අංක 09**

හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් තිරු ක්‍රමයට පිළියෙල කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කළ යුතු විය. නිවැරදි උත්තරය සැපයීමට සමත් අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අඩු මට්ටමක පැවතුණි. ලාභය නිවැරදිව ගණන් බැලීමට හා නිවැරදි ලාභය ගලපා හවුල්කරුවන් අතර නිවැරදි අනුපාතයට බෙදා පෙන්වීමට අයත් ලකුණු ලබා ගැනීමට වැඩිදෙනෙක් සමත් වී නැත. ජංගම ගිණුම සහ ලාභ'ලාභ විසර්ජන ගිණුම නිවැරදිව ඉදිරිපත් කිරීමට අසමත්වීම ඊට හේතුවයි. හවුල්කරු (නිශාන්ත) විසින් ලබාගත් ණයට අදාල ණය පොලිය ලාභයට ගැලපීම හා ජංගම වත්කමක් ලෙස පෙන්නුම් කර නොතිබූ අයදුම්කරුවන් ද විය. හවුල් ව්‍යාපාර සම්බන්ධව මූලික ගැටළු පිළිබඳ දැනුම පරීක්ෂාවට යොමුකළ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් මුළු ලකුණු ලබා ගැනීමට සමත් ප්‍රතිශතය පහත මට්ටමක විය.

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 10**

සමාගම් සම්බන්ධයෙන් කළමනාකරණයේ භාවිතය සඳහා වර්ෂය අවසානයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය පිළියෙල කිරීමට තිබුණි. හානි තොග හා ණයකර පොලී සම්බන්ධ ගැටළුවට අදාල ගැලපුම් සටහන් අයදුම්කරුවන් බහුතරයක් නිවැරදිව ගලපා නොමැත. LKAS ගිණුම්කරණ ප්‍රමිත කෙරෙහි අවධානය යොමු විය යුතුය. බොහොමයක් අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි. නියමිත ආකෘතියට, රටාවට අනුව උත්තර ලිවීමට අයදුම්කරුවන් උත්සාහ කර ඇත. සමස්ථයක් වශයෙන් සමාගම් ගිණුම් පිළිබඳ දැනුම විමසීමට ඉදිරිපත් කර ඇති සරල ගැටළු ඇතුලත්ව තිබේ. විස්තීර්ණ ආදායම් ප්‍රකාශය නිවැරදි ආකෘතියට ඉදිරිපත් කිරීම අයදුම්කරුවන්ගෙන් බලාපොරොත්තු විය.

රඳවාගත් ඉපැයීම් හර ශේෂය කෙරෙහි අවධානය යොමු නොකර එය බැර ශේෂයක් වශයෙන් උපුටා ගත් අයදුම්කරුවන් ද විය. පරිපාලන, බෙදාහැරීමේ හා මූල්‍ය වියදම් පෙරවැඩ ලෙස පෙන්වූ අයදුම්කරුවන් නියමිත ලකුණු රැස්කර ගැනීමට සමත් විය. ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ මූලික දැනුම නොමැති වීම සමහර අයදුම්කරුවන්ගේ දුර්වලතාවයක් වේ. උපචිත සහ කලින් ගෙවූ වියදම් ගැලපුම් විසඳීමේදී හර, බැර සටහන් පිළිබඳ මූලික අවබෝධය අයදුම්කරුවන්ට නැති බව අනාවරණය විය. මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අදාල සටහන් නිවැරදි ස්ථානවල හා ආදායම් ප්‍රකාශයට අයත් සටහන් නිසිපරිදි ඉදිරිපත් කිරීමට සැළකිලිමත් විය යුතුය.

ආදායම් බදු ගැලපුම, තොග හානි ගැලපුම හා ණයකර පොලී නිසිපරිදි ගැලපීම නොකළ නිසා සමහරෙකුට මුළු ලකුණු ලබා ගැනීමට නොහැකි විය. හානි තොග, අවසාන තොගයට ඇතුලත්ව නැති බව සළකා වෙළෙඳ ගිණුමේ ගැනුම් වලට ගැලපීම සමගබන්ධයෙන් බොහෝ අයදුම්කරුවන් අවධානය යොමුකර නැත.කාල කළමනාකරණය සැළකිල්ලට ගෙන අවශ්‍ය ඉල්ලා ඇති තොරතුරු ලබා දීම ලකුණු රැස්කිරීමට හේතු වේ. ක්ෂය වීම් නිවැරදිව ගණනය කර ගැලපීමට බොහෝ දෙනෙක් අසමත්ව ඇත.

**පොදු කරුණු:**

මූලික ගිණුම්කරණ මූලධර්ම, නව ගිණුම්කරණ ප්‍රමිත, සමාගම් පනත පිළිබඳ අවබෝධය ලබාගත යුතුය. ප්‍රශ්න වලට උත්තර ලිවීමේදී පිටු වෙන්කර, ප්‍රශ්න අංක නිවැරදිව යෙදීම (ඇතැම් අයදුම්කරුවන් පිටු අංක කිරීම, ප්‍රශ්න අංක ලෙස දක්වයි). උත්තර ආසන්නයෙන්ම අදාල පෙරවැඩ පෙන්වීම හා ප්‍රශ්නයේ කොටස් තැනින් තැන වෙනත් පිටුවල පෙන්වීමෙන් වැලකීම, එසේ පෙන්වීමට සිදුවන අවස්ථාවල සටහනකින් අදාල පිටුවට අවධානය යොමු කරවීම වැදගත් වේ.

සමාගම් පනත හා 1890 හවුල් ආඥා පනත, LKAS ගිණුම්කරණ ප්‍රමිත පිළිබඳ දැනුම හා ගිණුම්කරණ න්‍යායාත්මක දැනුම වර්ධනය කර ගැනීමට තවදුරටත් අයදුම්කරුවන් ක්‍රියාකළ යුතු වේ.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම වැඩිදියුණු කර ගැනීම සඳහා සැලකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(2) ප්‍රශ්න පත්‍රය ඔබට ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවන්න (ඒ සඳහා අමතර කාලයක් දෙනු ලැබේ).

(3) අයදුම්කරුවන් ප්‍රවේශමෙන් ප්‍රශ්නය කිප වතාවක් කියවා අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු නිවැරදි උත්තරයක් අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමනාකරණය කරගන්න.

(5) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංකය සහ ඔබේ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(6) කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථන වලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(7) අත් අකුරු කියවිය හැකි මට්ටමට තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සහතික විය යුතුය.

(8) ස්වඅධ්‍යයන පාඩම්මාලා පොත්, ලිපි සඟරා ආදිය කියවිය යුතුය.

(9) ඔබේ දැනුම වැඩිදියුණු කිරීමට, පෙර ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(10) හොඳ සූදානමකින් විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීම.

- * * -